# ශ්‍රී ලංකාවේ ආර්ථික වෘද්ධි ක්‍රියාවලියේ ගැටලු සහ අභියෝග



ආර්ථික විද්‍යා දේශක
**තිළිණ සජිත් කරුණාතිලක**

**පසුගිය සතියේදී අප සාකච්ඡා කරන ලද්දේ ශ්‍රී ලංකාව මුහුණ දී ඇති ආර්ථික අභියෝගයන් කිහිපයක් පිළිබඳවය. මෙම ලිපිය මගින් ඒ පිළිබඳව තවදුරටත් අවධානය යොමු කරමින් ශ්‍රී ලංකාව මුහුණ දෙන අභියෝග පිළිබඳව අවධානය යොමු කරමු.**

වියපත් ජනගහන ප්‍රතිශතය ඉහළ යාමේ ප්‍රවණතාව

රටක සංවර්ධනය ඇගයීම සඳහා පවතින මිනුම් දඬු අතර සමාජයීය සංවර්ධනය මිනුම් කිරීමට භාවිත කරනු ලබන මිනුම් දඬු කිහිපයක් පවතී. අධ්‍යාපනය හා සෞඛ්‍ය ක්ෂේත්‍රයන් මෙහිදී වැඩි අවධානයක් ගනු ලබයි. ශ්‍රී ලංකාව මෙම දර්ශක අතරින් සංවර්ධිත රටවලට ආසන්න මට්ටමට ළඟාවීමට සමත්ව ඇති බව නිරීක්ෂණය කළ හැකිය. ඉන් පැහැදිලි වන්නේ එම ක්ෂේත්‍රයන් තුළ ශ්‍රී ලංකාව ලබා ඇති ප්‍රගතියයි. එහෙත් සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙස වියපත් ජනගහන ප්‍රතිශතය ඉහළ යාමේ ප්‍රවණතාව රට මුහුණ දෙන අභියෝගයක් ලෙස දැක්විය හැකිය. ලෝක බැංකුවට අනුව දකුණු ආසියානු රටවල් අතර වියපත්ම ජනගහනය සහිත රට වන්නේ ශ්‍රී ලංකාවයි. ගෝලීය දත්ත අනුව වේගයෙන්ම ජනගහනය වියපත් වන රටවල් කාණ්ඩයට ද ශ්‍රී ලංකාව අයත් වේ.

වියපත් ජනගහනයට අයත් වන්නේ වයස අවුරුදු 65ට වඩා වැඩි පිරිස වන අතර අවුරුදු 15 ට වඩා අඩු පිරිස ළමා ජනගහනය ලෙස වර්ග කරනු ලබයි. මෙම කණ්ඩායම් දෙක ආර්ථික වශයෙන් ක්‍රියාකාරී නොවන අතර ආර්ථික වශයෙන් ක්‍රියාකාරීවන්නේ ශ්‍රම බළකාය හෙවත් වයස අවුරුදු 15ට වැඩි සහ 65ට අඩු පිරිසය.

2001 වර්ෂයේ දී ආසන්න වශයෙන් ශ්‍රී ලංකාවේ පුද්ගලයින් 10කට එක් පුද්ගලයෙක් වියපත් ජනගහනයට අයත් වූ අතර වසර 2031 දී පුද්ගලයින් 5කට එක් අයෙක් වියපත් ජනගහනයට අයත් වේ. ලෝක බැංකු පුරෝකථනයන්ට අනුව වසර 2100 වන විට සෑම පුද්ගලයින් පස්දෙනෙකුගෙන් දෙදෙනෙක් වියපත් ජනගහනයට අයත් වේ. මින් පැහැදිලි වන්නේ ශ්‍රී ලංකාවේ ජනගහනය වේගයෙන් වියපත් වන බවත් ඉදිරි සංවර්ධන ඉලක්ක තුළ ඒ පිළිබඳව වැඩි අවධානයක් යොමු කළ යුතු බවත් වේ. ජනගහනය වියපත් වීම කෙරෙහි බලපානු ලබන ප්‍රජා විද්‍යාත්මක සාධක හතරක් හඳුනාගෙන ඇත. පහළ යන සාඵල්‍යතා අනුපාතිකය, පහළ යන මර්ත්‍යතා අනුපාතිකය, ඉහළ ආයු අපේක්ෂාව සහ සංක්‍රමණ වශයෙනි.

මෙම ප්‍රජා විද්‍යාත්මක හේතු මත ජනගහනය වියපත් වීමේ ක්‍රියාවලිය අදියර තුනක් යටතේ විග්‍රහ කරනු ලබයි. පළමු අදියරයේදී ළමා ජනගහනයත් දෙවන අදියරයේදී වැඩ කරන වයසේ ජනගහනයත් සාපේක්ෂව ඉහළ ප්‍රතිශතයක් ගනී. තෙවන අදියරයේදී වියපත් ජනගහනය සාපේක්ෂව ඉහළ ප්‍රතිශතයක් ගනු ලබයි. ශ්‍රී ලංකාව වර්තමානයේ පසුවන්නේ තෙවන අදියර දක්වා පරිවර්තනය වන සංක්‍රාන්ති අවස්ථාවකය. ආර්ථික විද්‍යාත්මකව සැලකූ විට තෙවන අදියර යනු ආර්ථික වෘද්ධි ක්‍රියාවලියේ අභියෝගාත්මක අවස්ථාවයි. එබැවින් පළමු හා දෙවන අදියර තුළදී සංවර්ධන ප්‍රතිපත්ති සම්පාදනය තුළ මේ පිළිබඳව අවධානය යොමු කළ යුතුවේ.

මෙම ජන විකාශ අදියරයන් පිළිබඳව අවබෝධ කරගත් රටවල් පළමු අදියරයේදී වඩාත් ස්ථාවර සාර්ව ආර්ථික පරිසරයක් තුළ ඒක පුද්ගල ආදයම වැඩිකර ගැනීමට සමත් වේ. දෙවන අදියරයේදී වැඩිවන ශ්‍රම බළකා නිෂ්පාදන ක්‍රියාවලියට යොද ගනිමින් නිෂ්පාදන විවිධාංගීකරණයට හා වර්ධනයට යොමු වේ. එමගින් ඉදිරි ආර්ථික අභියෝගයන්ට මුහුණ දීමට අවශ්‍ය ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග සම්පාදනය කර ගැනීමක් සිදු කරයි. එහි ප්‍රතිඵලය ලෙස තෙවන අදියරයේදී ද ස්ථාවර හා ශක්තිමත් ආර්ථිකයක් පවත්වාගෙන යාමේ හැකියාව ලබා ගනී.

ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් සැලකූ විට පළමු හා දැනට පවතින දෙවන ජන විකාශන අදියරයන්හිදී අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමේ පසුගාමී බවක් දක්නට ලැබේ එබැවින් ඉදිරි ජන විකාශන අදියර අභියෝගාත්මක අදියරක් බවට පත්වනු නොඅනුමානය. මෙම තත්ත්වය තුළ ශ්‍රී ලංකාව මුහුණ දෙනු ලබන අභියෝග පහත පරිදි පෙළගැස්විය හැකිය

**1. වියපත් ජනගහනය උදෙසා විශ්‍රාම සැලසුම් ආදයම් මාර්ග**

ශ්‍රී ලංකාවේ වියපත් ජනගහනයෙන් සියයට 10% (සියයට දහයක්) පමණ පිරිසක් විධිමත් විශ්‍රාම සැලසුම් ක්‍රමයකට සම්බන්ධ වී ඇත. නාගරීකරණය, කාන්තාවන් රැකියාවන්ට යොමු වීමේ නැඹුරුතාව, සීමිත සාමාජිකයන් සහිත පවුල් නිර්මාණය වීම වැනි හේතු මත වියපත් ජනගහනය කෙරෙහි විශ්‍රාම සැලසුම් ක්‍රමයක අවශ්‍යතාව තීව්‍ර වෙමින් පවතී. වියපත් ජනතාව පහසුවෙන් විවිධ තත්ත්වයන්හි ගොදුරු බවට පත්වීමේ (Vulnerable population) අවදානම සාපේක්ෂව ඉහළ බැවින් ඔවුන් උදෙසා සමාජ ආරක්ෂණ ජාලයන්හි අවශ්‍යතාව ඉතා දැඩි වේ.

**2. යැපුම් අනුපාතය ඉහළ යාම**

ඉහළ ආයු අපේක්ෂාව හේතුවෙන් විශ්‍රාම කාලය වඩාත් දීර්ඝ වන බැවින් හා එම කාලය තුළ ආදයම් මාර්ග නොමැතිවීම තුළින් යැපුම් අනුපාතය ඉහළ යාමක් සිදු වේ. එම තත්ත්වය ශ්‍රම බළකාය මත පීඩනය වැඩි කිරීමට හේතු වේ.

**3. රාජ්‍ය අයවැය මත පීඩනය**

වියපත් ජනගහනය උදෙසා රාජ්‍ය වියදම් වැඩිවීම හේතුවෙන් අනෙකුත් අංශ කෙරෙහි රාජ්‍ය වියදම් සීමා කිරීමට සිදුවේ. විශේෂයෙන් මේ සඳහා වැඩි බලපෑමක් සිදුවන්නේ ආණ්ඩුව විසින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන ව්‍යාපෘතීන් කෙරෙහිය.

**4. ඉතුරුම් කෙරෙහි සිදු කරන අහිතකර බලපෑම**

වියපත් ජනගහනය ආර්ථික වශයෙන් අවම ශක්‍යතාවක් පෙන්නුම් කරන බැවින් දේශීය ඉතුරුම් අනුපාතය කෙරෙහි අහිතකර ලෙස බලපානු ඇත. මෙම තත්ත්වය දේශීය ප්‍රාග්ධන සම්පාදන ක්‍රියාවලියට අහිතකර ලෙස බලපානු ඇත.

**5. ශ්‍රම බළකාය හීනවීම**

ශ්‍රම බළකාය හෙවත් වැඩ කරන වයසේ පසුවන සේවා නියුක්තිකයින් හා වෘත්තිකයින් ප්‍රමාණය අඩුවීම හේතුවෙන් නිෂ්පාදන ක්‍රියාවලිය වර්ධනයට අහිතකර බලපෑම් ඇති වේ. වේගයෙන් වර්ධනය වන සංචාරක හා ඉදිකිරීම් කර්මාන්තය තුළ මෙම ගැටලුව වඩාත් තදින් බලපානු ඇත. එවැනි තත්ත්වයක් තුළ විදේශීය ශ්‍රමිකයින් රට තුළට ප්‍රවේශවීම දැනට පවතින ගෙවුම්ශේෂ අර්බුදය තීව්‍ර කරනු ඇත. මෑතකාලීනව ඉන්දියානු පාකිස්තානු චීන වැනි වෙනත් රටවල ශ්‍රමිකයින් ගේ පැමිණීම වර්ධනය වීම කෙරෙහි මෙම තත්ත්වය ද යම් දායකත්වයක් දක්වා ඇති බව විශ්වාස කෙරේ. විදේශීය ශ්‍රමිකයින් රට තුළට පැමිණීම හා දේශීය ශ්‍රමිකයින් අඩු ඵලදායි ආර්ථික කටයුතුවලට රාශිගතවීම හේතුවෙන් නිෂ්පාදන වර්ධනය සෘජු ප්‍රතිලාභවලින් කොටසක් අහිමි වීමේ නැඹුරුතාවක් පවතී.

**6. රාජ්‍ය ආදයමට සිදුකරන බලපෑම**

ආර්ථික වශයෙන් සක්‍රීය ජනගහනය අඩු වනවිට රජයේ බදු ආදයම් පිරිහේ. මෙම තත්ත්වය රාජ්‍ය අයවැය හිඟය කෙරෙහි අහිතකර ලෙස බලපානු ඇත.

**7. වියපත් ජනගහනය අතර කාන්තාවන් ප්‍රතිශතය ඉහළ යාම**

කාන්තාවන් පුරුෂ පාර්ශ්වයට වඩා අවදානමට ගොදුරුවීමේ ශක්‍යතාව ඉහළ වේ. එසේම ඔවුන් ආර්ථික ක්‍රියාකාරකම්වලට යොමුවීමේ අවම මට්ටමක පැවතීමත් අවශ්‍යතාවන් සාපේක්ෂව ඉහළ මට්ටමක පැවතීමත් හේතුවෙන් මෙම ගැටලුව තීව්‍ර වේ.

### 8. වියපත් ජනගහනය තුළ බෝ නොවන රෝග බහුලවීම

ශ්‍රී ලංකාවේ වියපත් ජනගහනය අතර දියවැඩියාව, රුධිර පීඩනය, හෘද රෝග, මානසික ආතතිය වැනි බෝ නොවන රෝග ඉහළ ව්‍යාප්තියක් නිරීක්ෂණය කළ හැකි ය. මෙම තත්ත්වය ඔවුන්ගේ ආර්ථික ක්‍රියාකාරිත්වය අඩාළ කිරීමට සමත් වේ.

### 9. දරිද්‍රතාව සම්බන්ධ තත්ත්වය

ආර්ථික ක්‍රියාකාරිත්වය අවමවීම, පහසුවෙන් රෝගවලට ගොදුරුවීම, ප්‍රවාහන අවශ්‍යතා, මානසික සෞඛ්‍ය ගැටලු වැනි තත්ත්වයන් මත වියපත් ජනගහනය දරිද්‍රතාවට ගොදුරු වීමේ නැඹුරුතාවක් පවතී. ඒ හේතුවෙන් ආර්ථිකයේ දරිද්‍රතාව වර්ධනය වේ.

ජනගහනය වියපත්වීමේ අභියෝගයන් සැලකීමේ දී ආර්ථිකමය වශයෙන් බරපතළ ගැටලුවලට මුහුණදීමට සිදුවන බව පැහැදිලි වේ. එහෙත් නිවැරදි ආර්ථික ප්‍රතිපත්තිමය වෙනස්කම් නිවැරදි අවස්ථාවේදී ගැනීම තුළින් ජනගහනය වියපත් වීම ආර්ථික වෘද්ධියේ සංධිස්ථානයක් හෙවත් මහඟු අවස්ථාවක් බවට පත්කර ගත හැකිය.

## වියපත් ජනගහනය කළමනාකරණය කිරීම

සංවර්ධනය වෙමින් පවතින රටවල දක්නට ලැබෙන නිසඟ ලක්ෂණයක් වන්නේ පුහුණු හා පර්යේෂණ අංශයන්හි ආයෝජනය අවම වීමයි. වියපත් පුද්ගලයින් යම් යම් වෘත්තීන්ට අදාළ විශේෂඥතාවක් සහිත වෘත්තිකයන් වන බැවින් ඔවුන් සතු දැනුම හා අත්දැකීම් පුහුණු හා පර්යේෂණ අංශයන්හි පහසුවෙන් උපයෝජනය කිරීමට හැකියාව පවතී.

ජනගහනය වියපත් වීමට බලපානු ලබන ප්‍රධාන හේතුවක් වන්නේ ඉහළ ආයු අපේක්ෂාවයි. ජාත්‍යන්තරව වියපත් ජනගහනය නිර්වචනය කරනු ලබන්නේ වයස අවුරුදු 65ට වැඩි පුද්ගලයින් ලෙස වුවද ශ්‍රී ලංකාවේ විශ්‍රාම වයස් සීමාව වයස අවුරුදු 60ක් වේ. එබැවින් ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් වියපත් ජනගහනය ලෙස වයස අවුරුදු 60ට වැඩි පුද්ගලයින් හැඳින්විය යුතුවේ. එබැවින් විශ්‍රාම වයස් සීමාව වයස අවුරුදු 65 දක්වා වැඩි කිරීම මගින් විශේෂඥ සේවානියුක්තිකයින් ප්‍රමාණය වර්ධනය කර ගත හැකිවේ.

ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය තුළ විශේෂඥ වෘත්තිකයින්ගේ දායකත්වය පැවතීම තුළින් කාර්යක්ෂම හා ඵලදායී ප්‍රතිපත්ති සම්පාදනය කිරීමට හැකියාව ලැබේ. එසේම වියපත් වෘත්තිකයින්ගේ අත්දැකීම් බහුලත්වය හා තරුණ වෘත්තිකයින්ගේ නවීන තාක්ෂණික දැනුම සංකලනය තුළින් එම ප්‍රතිපත්ති වඩාත් ප්‍රායෝගිකව සංවර්ධන ඉලක්කගත ප්‍රතිපත්ති බවට පරිවර්තනය කර ගත හැකිය.

වියපත් ශ්‍රමිකයින් තුළ දක්නට ලැබෙන වෘත්තීය ආචාර ධර්ම, කණ්ඩායම් ක්‍රියාකාරිත්වය, පක්ෂපාතීත්වය, සමාජ සම්බන්ධතා, නායකත්වය හා කැපවීම වැනි ආවේණික ලක්ෂණයන් තුළින් ආයතන කළමනාකාරිත්වය පහසුවීම.

වියපත් පුද්ගලයින් සමාජයීය නායකත්වයට යොමු කිරීම තුළින් සමාජ සංවර්ධන කටයුතු පහසු වීම හා දරුවන් රැකබලා ගැනීම වැනි දෛනික කුටුම්බ කටයුතුවලට සහාය දැක්වීම තුළින් කාන්තා සේවා නියුක්තිය ඉහළ නංවා ගැනීමට දායකත්වයක් ලැබීම.

## සිදුකළ යුතු ප්‍රතිපත්තිමය වෙනස්කම්

ජනගහනය වියපත් වීමේ ප්‍රවණතාව පිළිබඳ මනා අවබෝධය තුළින් කාලීන ප්‍රතිපත්ති වෙනස්කම් සිදු කිරීම වැදගත් වේ. එහිදී විශේෂයෙන් අවධානය යොමු කළ යුතු කරුණු කිහිපයකි.

1. සමාජ ආරක්ෂණ ජාල පුළුල් කිරීම
2. වියපත් ජනගහනය ප්‍රමුඛ කරගත් සෞඛ්‍ය පහසුකම් පුළුල් කිරීම
3. වත්මන් ශ්‍රම බළකාය ඉලක්ක කරගත් සෞඛ්‍ය හා පෝෂණ වැඩසටහන් වැඩි දියුණු කිරීම මගින් වයස්ගත වන ජනගහනයේ ශාරීරික යෝග්‍යතාව පුළුල් කිරීම
4. ස්වයං රැකියා, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් දියත් කිරීම තුළින් සේවා නියුක්ති අවස්ථා වර්ධනය කිරීම
5. සමානත්වය, සාධාරණත්වය හා තිරසාරත්වය ප්‍රමුඛ කරගත් සමාජයීය ප්‍රතිසංස්කරණ වැඩසටහන් දියත් කිරීම තුළින් වෙනස් කොට සැලකීම් ඉවත් කිරීම
6. දරිද්‍රතාවේ ප්‍රාදේශීය විෂමතා ඉවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
7. පුහුණු හා පර්යේෂණ අංශයට සිදු කරන ආයෝජන වැඩි කිරීම
8. වියපත් ජනගහනය ඉලක්ක කරගත් ඉතිරි කිරීම් හා ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් ප්‍රවර්ධනය